Visakha Vidyalaya

# විශාඛා විද්‍යාලය

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය

අවසාන වාර පරීක්ෂණය - 2016 ජුනි

## ආර්ථික විද්‍යාව II

13 ශ්‍රේණිය

කාලය : පැය තුනයි

නම / අංකය : ..............................................................................................

* එක් කොටසකින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.

### "අ" උප කොටස

1. i. සම්පත් හිඟකම හා තේරීම අතර සම්බන්ධය විග්‍රහ කරන්න. (ලකුණු 4)

ii. (අ) ආර්ථික පද්ධතියක ආයතනික ලක්ෂණයන්ගේ ස්වරූප කවරේද? (ලකුණු 2)

(ආ) සැලසුම්කරණය නිර්ණායකයක් ලෙස සලකා ආර්ථික පද්ධති වර්ග කරන්නේ කෙසේද? (ලකුණු 2)

iii. (අ) විකල්ප ආර්ථික පද්ධති නිර්මාණය වීමේ ලා ආදායම් පුනර්ව්‍යාප්තිය හා සමාජ ආරක්ෂණ ජාල ක්‍රියාකාරීත්වය පදනම් වී ඇත්තේ කෙසේදැයි දක්වන්න. (ලකුණු 2)

(ආ) නව සාම්ප්‍රදායික ආර්ථික පද්ධති කියා හඳුන්වන්නේ කුමක්ද? (ලකුණු 2)

iv. මිශ්‍ර ආර්ථික පද්ධතියක සුවිශේෂතාව පරීක්ෂා කරන්න. (ලකුණු 4)

v. (අ) ආර්ථික පද්ධතියක කාර්ය සාධනය ඇගයීමේලා යොදාගන්නා නිර්ණායක කවරේද? (ලකුණු 2)

(ආ) ආර්ථික වෘද්ධියේ ස්වරූප ද්විත්වය නිෂ්පාදන හැකියා මායිමක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

2. i. සාමාන්‍ය ඉල්ලුම් හා සැපයුම් වක්‍ර සහිත වෙළෙඳ පොළක සමතුලිත හුවමාරුවේ වෙනසක් සිදු නොවන පරිදි ඉල්ලුම් හා සැපයුම් බලවේග වෙනස් විය හැකි ආකාර කවරේද? (ලකුණු 2)

ii. භාණ්ඩයකට බද්දක් පැනවූ විට එම භාණ්ඩයේ මිල වෙනස් නොවිය හැක්කේ කවර ඉල්ලුම් හා සැපයුම් තත්ත්වයන් යටතේද? (ලකුණු 2)

iii. සැපයුම් නම්‍යතාව නිර්වචනය කර සරල රේඛීය සැපයුම් වක්‍රයක් මත එම නම්‍යතාව නොවෙනස්ව පවතින අවස්ථා රූපසටහන් මගින් නිවැරදිව දක්වන්න. (ලකුණු 4)

iv. උපරිම මිල නියමකිරීමක් ගැනුම්කරුවන් සම්බන්ධයෙන් යහපත් වුවද සමාජය සම්බන්ධයෙන් අයහපත් බව පවසන්නේ මන්ද? රූප සටහනක් මගින් විස්තර කරන්න. (ලකුණු 4)

v. එක්තරා භාණ්ඩයක ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත දැක්වේ.

$$Qd = 1000 - 10P$$

$$Qs = -200 + 10P$$

මෙම භාණ්ඩය අලෙවි කිරීමේදී රජය විසින් රු. 80 ක සහතික මිලක් ලබාදෙන බවට එකඟවී ඌණ පූර්ණ ගෙවීම් ක්‍රමයක් රජය ක්‍රියාත්මක කරන ලදී. පහත දෑ ගණනය කරන්න.

a. සහතික මිල ලබාදීමට පෙර වෙළෙඳ පොළේ සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය (ලකුණු 2)

b. සහතික මිල ලබාදුන් පසු පාරිභෝගික අතිරික්තය වෙනස් වූ ප්‍රමාණය (ලකුණු 2)

c. සහතික මිල ලබාදී මෙන් පසු නිෂ්පාදක අයභාරයේ වෙනස් වූ ප්‍රමාණය (ලකුණු 2)

d. සහතික මිල නියම කිරීම නිසා සමාජයට අහිමි වන ශුභ සාධනය (ලකුණු 2)



Scanned by CamScanner

3. i. කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලිය හා දිගු කාලීන නිෂ්පාදන ක්‍රියාවලිය අතර වෙනස පෙන්වා දෙන්න. (ලකුණු 3)

ii. පහත සඳහන් සංකල්ප අතර වෙනස පහදන්න.

(අ) ලාභය හා නිෂ්පාදන අතිරික්තය

(ආ) ආර්ථික ක්ෂයවීම හා ක්‍රමක්ෂය ගාස්තු

(ලකුණු 4)


iii. "ස්ථිතික ආර්ථිකයක ආර්ථික ලාභය ශුන්‍ය වුවත් ගතික ආර්ථිකයක ව්‍යවසායකයා ආර්ථික ලාභ උපයා ගනී" යන ප්‍රකාශය ඔබ එකඟ වන්නේ ද? පහදන්න. ගතික ආර්ථිකයක ආර්ථික ලාභ සාධාරණීකරණය කිරීමට බලපාන හේතු කවරේද?

(ලකුණු 4)

iv. වෙළෙඳ පොළ ව්‍යුහය වර්ග කිරීමට බලපාන නිර්ණායක කවරේද?

(ලකුණු 3)

v. පහත දැක්වෙන්නේ පූර්ණ තරග ආයතනයක හැසිරීම පෙන්නුම් කරන රූප සටහනකි.




a. ඉහත වෙළඳපොලේ ඒකකය මිල රු. 20 ක් වන විට නිෂ්ප්‍රාමාණික ලාභ කොපමණද? (ලකුණු 1)

b. මෙම ආයතනයේ ආර්ථික ලාභ ශුන්‍යවන මිල කොපමණද? ආර්ථික ලාභ ශුන්‍ය වුවත් නිෂ්පාදනයේ යෙදී සිටින්නේ ඇයි?

(ලකුණු 2)

c. මෙම ආයතනයේ අලාභ ලබමින් නිෂ්පාදනයේ යෙදී සිටින මිල කුමක්ද? එම මිල අලාභ ලබන මිලක් ලෙස සලකන්නේ ඇයි?

(ලකුණු 2)

d. ඉහත ආයතනය අලාභ අවම කිරීමට ගනු ලබන තීරණය කුමක්ද? එම තීරණයට හේතු පහදන්න. (ලකුණු 1)

4. i. පහත එක් එක් අයිතමයන් ජාතික ගිණුම්කරණයේදී, සමස්ත නිමැවුමේ වටිනාකම ගණනය කිරීමට අදාල කරගන්නේ ඇයිද? යන්න වෙන වෙනම පැහැදිලි කරන්න.

අ) ප්‍රාග් ධන ක්ෂයවීම

ආ) තොග වෙනස්වීම්

ඇ) ශුද්ධවක්‍ර බදු

(ලකුණු 3)

ii. "යම් ආර්ථිකයක මුළු සම්පත්, එම ආර්ථිකයේ සම්පත් උපයෝජනයට සමාන වේ". මෙය ඔබ පැහැදිලි කරන්නේ කෙසේද?

(ලකුණු 3)

iii. ශ්‍රී ලංකාව මෑත වර්ෂ වලදී ජාතික ගිණුම් සම්පාදනයෙහි ලා සිදුකර ඇති ප්‍රතිසංස්කරණ මොනවාද? (ලකුණු 4)

iv. "ගෙවුම් ශේෂයේ වර්තන ගිණුමේ ශේෂය රටක ජාතික ගිණුම්වල ප්‍රධාන සංරචකයකි" වර්තන ගිණුමේ විවිධ අයිතමයන් ජාතික ගිණුම්වලට කරනු ලබන බලපෑම් කෙටියෙන් දක්වමින් එම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 4)

v. පහත දැක්වෙනුයේ කල්පිත ආර්ථිකයක ජාතික ගිණුම්කරණ තොරතුරු කිහිපයකි. (රු. බිලියන)

| | |
|---|---|
| ශුද්ධ වක්‍ර බදු | 40 |
| දේශීය ආදායම | 200 |
| පෞද්ගලික ආදායම් බදු | 30 |
| ප්‍රාග්ධන ක්ෂය වීම | 10 |
| ජාතික ආදායම | 195 |
| පෞද්ගලික ආදායම | 180 |
| පෞද්ගලික ඉතුරුම් | 15 |

පහත දැහි අගය ගණනය කරන්න.

(අ) වෙළෙඳ මිල මත ගණනය කළ දළ දේශීය නිෂ්පාදිතය (ලකුණු 2)

(ආ) වැය කළ හැකි පෞද්ගලික ආදායම (ලකුණු 2)

(ඇ) පෞද්ගලික පරිභෝජන වියදම (ලකුණු 2)



Scanned by CamScanner

5. i. (අ) $C = a + bYd$ යන පරිභෝජන ශ්‍රිතය ඇසුරෙන් ඉතුරුම් ශ්‍රිතය ව්‍යුත්පන්න කරන්න. (ලකුණු 2)

(ආ) ඉහත පරිභෝජන ශ්‍රිතයට $t$ යනුවෙන් ස්වාධීන බද්දක් හා $r$ යනුවෙන් රජයේ සංක්‍රාම ගෙවීම් කළ පසු පරිභෝජන ශ්‍රිතය වෙනස් වන ආකාරය දක්වන්න. (ලකුණු 2)

ii. (අ) විවෘත ආර්ථිකයක සමස්ත ආදායම් හා වියදම් සමතුලිතයක දී සමස්ත කාන්දුවීම් සහ සමස්ත විදීම් සමාන වන බව ඔප්පු කරන්න. (ලකුණු 2)

(ආ) විවෘත ආර්ථිකයක කාන්දුවීම් නම් කර ඒවා කාන්දුවීම් කියා නම් කිරීමට හේතුව දක්වන්න. (ලකුණු 2)

iii. සංවෘත ආර්ථිකයක කාන්දුවීම් වලට වඩා විදීම් ඉහළ අගයක් ගන්නා අවස්ථාවක් රූප සටහනක පෙන්වා එහි ප්‍රතිවිපාකය කුමක්දැයි පෙන්වා දෙන්න. (ලකුණු 4)

iv. පහත සඳහන් සිදුවීම් සමතුලිත නිමැවුමට බලපාන ආකාරය සරල ආදායම් හා වියදම් ප්‍රවේශය ඔස්සේ රූප සටහන් මගින් ඉදිරිපත් කරන්න.

(අ) ස්වාධීන ආයෝජන ඉහළ නැංවීම

(ආ) ආන්තික පරිභෝජන නැමියාව ඉහල යාම

(ඇ) ආන්තික ඉතුරුම් නැමියාව ඉහළ යාම

(ඉ) ස්වාධීන බදු ඉහළ නැංවීම (ලකුණු 4)

v. ආන්තික පරිභෝජන නැමියාව 0.8 වන සංවෘත ආර්ථිකයක තුලිත අයවැයක් පවතින විට සමාහාර ඉල්ලුමට ඇතිවන බලපෑම කුමක්දැයි සංඛ්‍යාත්මකව පෙන්වා දෙන්න. (ලකුණු 4)

## "ආ" උප කොටස

6. i. මුදල් පදනම යන්නෙන් කුමක් අදහස්වේද? එහි ප්‍රධාන සංරචක කවරේද?
මුදල් පදනම වෙනස්වීම කෙරෙහි බලපාන සාධක කවරේද? (ලකුණු 4)

ii. මුදල් පදනම, මුදල් සැපයුම හා දළ ජාතික නිෂ්පාදිතය අතර ඇති සම්බන්ධය විග්‍රහ කරන්න. (ලකුණු 2)

iii. ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනයක් හා පිරිවැයෙන් තල්ලු වුණු උද්ධමනයක් පහත දැක්වෙන එක්එක් අයිතම වලට කරනු ලබන බලපෑම කෙටියෙන් වෙන වෙනම පැහැදිලි කරන්න.

(අ) මූර්ත නිමැවුම

(ආ) නාමික නිමැවුම

(ඇ) සේවා නියුක්තිය (ලකුණු 3)

iv පහත සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න.

(අ) මූලික උද්ධමනය

(ආ) ජාතික පරිභෝගික මිල දර්ශකය

(ඇ) නිෂ්පාදකයාගේ මිල දර්ශකය (ලකුණු 3)

v. එක්තරා කල්පිත ආර්ථිකයක පටු මුදල් සැපයුම ($M_1$) රුපියල් බිලියන 220 ක් බවත්, ඉන් රු. බිලියන 20 ක් මහජනයා අතර සංසරණය වන ව්‍යවහාර මුදල් වන බවත් සිතන්න. මෙම ආර්ථිකයේ වාණිජ බැංකු පද්ධතිය තුල පවතින තැම්පතු ගුණකය 5 ක් යැයි තක්සේරුකර ඇත.

(අ) මෙම වාණිජ බැංකු පද්ධතිය සතුව අධි සංචිත නොපවතින බව උපකල්පනය කර, බැංකු පද්ධතියේ ශේෂ පත්‍රය දක්වන්න. (ලකුණු 2)

(ආ) මෙම ආර්ථිකයේ මුදල් ගුණකයේ අගය සොයන්න. (ලකුණු 2)

(ඇ) මෙම ආර්ථිකයේ මහ බැංකුව සංචිත අවශ්‍යතාවය 25% ක් ලෙස වෙනස් කළේ නම් ඉහත (අ) හා (ආ) යන ප්‍රශ්නවලට ලැබෙන පිළිතුරු වෙන වෙනම දක්වන්න. (ලකුණු 4)

7. i. තොරතුරු අසම්පූර්ණත්වය වෙළෙඳ පල අසමත්වීමට බලපාන ආකාරයත් එය නිවැරදි කිරීමට රජය මැදිහත් වන ආකාරයත් පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. නිෂ්පාදන හා පරිභෝජන ක්‍රියාවලියකදී පෞද්ගලික පිරිවැයට හා ප්‍රතිලාභයට අමතරව බාහිර පිරිවැයක් හා ප්‍රතිලාභයක් පවතී යන ප්‍රකාශය පහදන්න. (ලකුණු 3)

iii. වෙළඳපොළ ආර්ථිකයක පෞද්ගලික අංශය පොදු භාණ්ඩ නොසැපයීමටත් රාජ්‍ය අංශය පොදු භාණ්ඩ සැපයීමටත් බලපාන හේතු පහදන්න. (ලකුණු 2)

iv. "මෑත වර්ෂවල රාජ්‍ය ආදායම අඩුවීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරයි"

(අ) 2014 වර්ෂයේ රාජ්‍ය ආදායම දළ දේශිය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද? (ලකුණු 1)

(ආ) මෑත වර්ෂවල රාජ්‍ය ආදායම අඩුවීමට බලපෑ හේතු කවරේද? (ලකුණු 2)

(ඇ) ලංකාවේ බදු අයභාරයේ සාධනය පහත් මට්ටමක පැවතීම අඛණ්ඩව සිදුවෙමින් පවතී යන්න පහදන්න. (ලකුණු 2)

v. (අ) 2014 ට අනුව වර්තන වියදමේ සංයුතිය ආර්ථික වර්ගීකරණය අනුව ලියා දක්වන්න. (ලකුණු 3)

(ආ) නිෂ්පාදකයින් ඇතුළු සමාජයට සහන සැලසීමට නිෂ්පාදන සහනාධාර ලබාදෙයි. ඒ සඳහා විපක්ෂව ඉදිරිපත් කළහැකි තර්ක මොනවාද? (ලකුණු 3)



Scanned by CamScanner

08\. i. මෑත කාලයේ ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳ ප්‍රතිපත්තියේ ප්‍රධාන ඉලක්කය සහ ඊට අදාල අරමුණු මොනවාද? (ලකුණු 4)

ii. ද්විත්ව සටහන් මූලධර්මයට අනුව පහත සඳහන් ගනුදෙනු නව ගෙවුම්තුලන ලේඛනයෙහි හිණුම්ගත කරන්නේ කොතැනද?

(අ) ඩොලර් මිලියන 800 ක් වටිනා ඇඟලුම් අපනයනය කිරීම

(ආ) ඩොලර් මිලියන 1000 ක් වටිනා මෝටර් රථ ආනයනය කිරීම

(ඇ) විදේශ ණය සඳහා පොලිය ලෙස ඩොලර් මිලියන 100 ක් ගෙවීම

(ඈ) ශ්‍රී ලංකිකයකු සතු බුද්ධිමය දේපලක් විදේශිකයෙකුට විකිණීම (ලකුණු 4)

iii. ශ්‍රී ලංකාවේ ආනයන හා අපනයන සංයුතියෙහි මෑත කාලීන උපනතීන් සැකෙවින් පරීක්ෂා කරන්න. (ලකුණු 4)

iv. පසුගිය වසර කිහිපයත තුළ ශ්‍රී ලංකාවේ විදේශ වත්කම් වල ආනයන ශක්‍යතාව කවර මට්ටමක පවතීද? එයට බලපෑ හේතු මොනවාද? (ලකුණු 4)

v. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය මුහුණ දෙන අභියෝග හා අපේක්ෂාවන් කවරේද? (ලකුණු 4)

9\. i. පහත සංකල්ප සංක්ෂිප්තව පැහැදිලි කරන්න.

(අ) විභව නිමැවුම

(ආ) ආර්ථික වෘද්ධිය

(ඇ) ආර්ථික සංවර්ධනය

(ඈ) සංවර්ධනය (ලකුණු 4)

ii. (අ) මානව සංවර්ධනයේ ප්‍රධාන පැතිකඩ හා ඒවායේ සාධණිය මට්ටම මිනුම් කරන දර්ශක කවරේදැයි දක්වන්න. (ලකුණු 2)

(ආ) දකුණු ආසියා කලාපය තුළ ශ්‍රී ලංකාවේ මානව සංවර්ධනය පිළිබඳ කුමක් කිව හැකිද? (ලකුණු 2)

iii. (අ) ජාතික දරිද්‍රතා ආපාතය හා ජාත්‍යන්තර දරිද්‍රතා ආපාතය විස්තර කරන්න. (ලකුණු 2)

(ආ) ශ්‍රී ලංකාවේ ජනගහන දරිද්‍රතා අනුපාතයේ උපනති විමසන්න. (ලකුණු 2)

iv. (අ) ශ්‍රී ලංකාවේ ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තියේ ලක්ෂණ දක්වන්න. (ලකුණු 2)

(ආ) ශ්‍රී ලංකාවේ ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තියේ ප්‍රතිලාභය කුමක්ද? (ලකුණු 2)

v. ශ්‍රී ලංකාවේ සේවා ව්‍යුක්තියේ සුවිශේෂතා පරීක්ෂා කරන්න. (ලකුණු 4)

ADVANCEDLEVELPAPERS SRI LANKA ALSCIENCEPAPERS.BLOGSPOT.COM

10\. i. ශ්‍රී ලංකාවේ ආයෝජනය සඳහා අරමුදල් ලැබෙන මූලාශ්‍ර කවරේද? (ලකුණු 4)

ii. පසුගිය වසරවල ශ්‍රී ලංකාවේ ආර්ථික වෘද්ධියට දායකවූ ප්‍රධාන මූලාශ්‍ර අනුපිළිවෙලින් පෙළ ගස්වන්න. (ලකුණු 4)

iii. "යහ පාලනය" යන්න අර්ථ දක්වන්න. සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථික වෘද්ධි ප්‍රවර්ධනය සඳහා එය කොතෙක් දුරට වැදගත් වේද? (ලකුණු 4)

iv. (අ) 2015 දී ප්‍රකාශ කරන ලද සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ (MDG) පිළිබඳ සමාලෝචන සමුළුවේදී තිරසාර සංවර්ධනය උදෙසා වූ 2030 න්‍යාය පත්‍රයට අනුව ගෝලීය වශයෙන් ශක්තිමත් කිරීමට යෝජිත ක්ෂේත්‍ර 5 කවරේද? (ලකුණු 2)

(ආ) 2011 වසරේදී යෝජනා කරන ලද දිවි නැගුම හා පුර නැගුම ව්‍යාපෘතීන්හි අරමුණු සසඳන්න. (ලකුණු 2)

v. 2005 වසරෙන් පසු ශ්‍රී ලංකා ආර්ථිකයේ අපනයන අභිමුඛ ප්‍රතිපත්තියේ යම් පසුබෑමක් සිදුවූබව ඔබ පිළිගන්නවාද? ඔබගේ පිළිතුර තහවුරු කර එවැන්නකට හේතුවූ සාධක දක්වන්න. (ලකුණු 4)



Scanned by CamScanner

WWW.LOL.LK

# BUY

## PAST PAPERS

## 071 777 4440

Buy Online - www.LOL.lk

- GCE O/L
- GCE A/L
- PAST PAPERS
- SHORT NOTES




Protect Yourself From Coronavirus

# YOU STAY AT HOME




# WE DELIVER!

**ORDER NOW**

**075 699 9990**

**WWW.LOL.LK**

**TOP CATEGORIES**

- GCE O/L Exam NEW
- Grade 09, 10 & 11
- Grade 06, 07 & 08
- Grade 04 & 05
- Grade 01, 02 & 03
- About Us
- Shop HOT
- Cart

HUGE SALE – SHOP NOW




**ISLANDWIDE DELIVERY**
Free delivery on all orders over Rs. 3500

**More than 1000+ Papers**
For all major Subjects and mediums

**ONLINE SUPPORT 24/7**
Shopping Hotline 071 777 4440

## FEATURED PRODUCTS

**SORT BY**

- GCE O/L Exam



GCE O/L EXAM, SCIENCE
O/L Science Past Paper Book
රු 350.00
− 1 + ADD TO CART




GCE O/L EXAM, MUSIC
O/L Music Past Paper Book
රු 350.00
− 1 + ADD TO CART



GCE O/L EXAM, MATHEMATICS
O/L Mathematics Past Paper Book
රු 350.00
− 1 + ADD TO CART



GCE O/L EXAM, INFORMATION & COMMUNICATION TECHNOL...
O/L Information & Communication Tec...
රු 350.00



GCE O/L EXAM, HISTORY
O/L History Past Paper Book
රු 350.00



GCE O/L EXAM, HEALTH & PHYSICAL EDUCATION
O/L Health & Physical Education Past P...
රු 350.00